# ශ්‍රී ලංකාවේ ආදී වාසී ජන වර්ගයක් වන වැදි ජනතාවගේ සමාජ, සංස්කෘතික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

එන්.ඩබ්ලිව්.එම්.එන්. මධුෂානි

තෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

*nmadushani398@gmail.com*

## හැඳින්වීම

ජන වර්ගයක් යනු මානසික වශයෙන් සහ ශාරීරික වශයෙන් ඒකාබද්ධතාවයක් පෙන්නුම් කරන එකිනෙකට බොහෝ සමානකමක් දැකිය හැකි කණ්ඩායමකි. ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම්, හා යුරෝපීය වශයෙන් සම්භවයක් ඇති පිරිස ජනකොටස් ලෙස ජීවත් වෙති. සිංහල හා දෙමළ යන භාෂාව ප්‍රමුඛ කරගෙන ප්‍රධාන ජන වර්ග දෙකට විවිධාකාරයෙන් සම්බන්ධ වී ජීවත් වන උපජන වර්ග කිහිපයක් ද ඇත (රත්නපාල, 2001: 30).

ඒ අනුව ලංකාවේ භාෂාත්මක බෙදීම් සහිත ව ජීවත්වන ජන වර්ග ගණනාවක් හඳුනාගත හැකි ය. එම ජන වර්ග අතර සුළු ජන වර්ග (ආදි වාසීන්) රැසක් ද සිටී. වැදි ජනතාව, කින්නර ජනතාව, අහිකුණ්ඨික ජනතාව ඒ අතර වේ (හුරුලුවැව, 2011: 94). තව ද ''නිට්ටෑවන්'' යැයි ජන කොටසක් ද මීට කලකට ඉහත මෙරට ජීවත් වූ බවට මූලාශ්‍රයවල වාර්තා වී තිබේ. ලංකාවේ වෙසෙන ප්‍රාථමික ජන කණ්ඩායම් අතුරින් සාම්ප්‍රදායික ව ප්‍රාථමික ගණයෙලා සැලකිය හැකි ප්‍රධානතම කණ්ඩායම වැදි ජනයා බව පෙන්වාදිය හැකි ය.

## ප්‍රභවය

වර්තමාන වැදි ජනතාව වාසය කරන්නේ වියලි කලාපයට අයත් ප්‍රදේශ වල ය. එහෙත් ආදිම වැද්දන් විසූ යැයි සැලකෙන තෙත් කලාපීය ගම් රාශියක් සබරගමුවෙහි පිහිටා ඇති බව පෙනී යයි (හුරුලුවැව,2011:108). එම ගම් වැදි ජනයාගේ නිජබිම ලෙස සැලකිය හැකි බව මානව විද්‍යාඥයින් පවසයි. 'වැද්දාගල' යන ග්‍රාම නාමය වැද්දන් එහි වාසය කළ බවට හොඳ ම සාක්ෂියකි. රඹුක්කන, පදවිගම්පල, සමනල අඩවිය, බටතොට හා බටදොඹලෙන යන ස්ථාන හා කුරගල ලෙන කැකුළ ගල්ලෙන ආශ්‍රිතව ආදිවාසි ජනතාව ජීවත් වූ බවට පුරාවිද්‍යාත්මක සාධක රැසක් අනාවරණය කරගෙන තිබේ (හුරුලුවැව,2011:112).

1911 දී සෙලිග්මාන් යුවළ විසින් සිදුකරන ලද පර්යේෂණයනට අනුව

උතුරු මැද, ඌව, උතුරු පළාතේ යන ප්‍රදේශ වල ද වැදි ජනතාව තම නිජබිම් පිහිටා ගෙන ඇත (රත්නපාල,2003:4). තව ද අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් වැදි ගම්මාන 46ක් තිබෙන බව ද තවත් පර්යේෂණවලින් හෙළි වී තිබේ (රත්නපාල,2003:27). ඌව පළාතේ වැදි නිජබිම් වන්නේ දඹාන, වටවන, කන්දෙගම්වෙල, කොටබකිනිය, සොරබොර ආදී ගම්ය. මුල්ලේගම, දානිගම, හේනේබැද්ද, දමනේගම, බලංගොඩ යන ගම් ද වැද්දන්ගේ නිජබිම් ය (හුරුළුවැව,2011:110). වැද්දන්ගේ නිජබිම් ලෙස සැලකිය හැකි පර්යේෂණාත්මක දත්ත රැසක් මේ වන විට රට පුරා ස්ථානවලින් සොයාගෙන තිබේ. ඒ අතර මානව ශරීර අවශේෂ කොටස්, ආහාරයට ගත් සතුන්ගේ ඇටකටු, ශෛලමය උපකරණ ආදිය තුලින් එළඹිය හැකි පැහැදිලි නිගමනය නම් වැදි ජනතාව යනු ලාංකික අනන්‍යතාව ඔප් නංවමින් මෙරට ප්‍රභවය වී විකසනය වූ ජන වර්ගයක් බව ය (හුරුළුවැව,2011:109).

### නාමකරණය

සිංහල මහා සමාජය විසින් " වැද්දන් " යනුවෙන් හඳුන්වන මෙම ජනතාව තමන් හඳුන්වා ගන්නේ " වන්නියලැත්තන් " යන නමිනි. "වැදි" යන සිංහල වචනය පාලි "ව්‍යාධ" (විදින්නා) යන්නෙන් බිඳී ආවකි. වැදි නාමය ජීවනෝපාය සඳහා, සතුන් මැරීමේ යෙදුනවුන් සඳහා පොදුවේ ව්‍යවහාර වුණු බවට සාධක සහිත ය (හුරුළුවැව,2011:92). එහෙත් "වැදි ජනයා" ලෙස හඳුන්වන්නේ තමාට ම ආවේණික වූ මානව ලක්ෂණ සහ සංස්කෘතියක් සහිත ජන කොට්ඨාශයකි.

වැද්දා යනුවෙන් හැඳින් වූ මේ ගෝත්‍රික ජනයා "පුලින්ද" යන නාමයෙන් ද හැඳින් වූ බව සඳහන් වේ. එමෙන් ම " සබර" යන්න ද ඔවුන් උදෙසා භාවිතා කළ තවත් නමකි. "ශබර" නැමැති සංස්කෘතික පදයෙන් "සබර" යන නම බිඳී ආවක් බව ද සඳහන් වේ (මව,vii:68). වැදි ජනතාව පිළිබඳ අවධානය යොමුකළ දෙස් විදෙස් විද්වතුන් සිටී. බොහෝ විදේශිකයන් වැද්දන් හැඳින්වූයේ " Ceylon Abrogean group" ලෙස ය (හුරුළුවැව 2011:92).

### ව්‍යාප්තිය

ආදීවාසි වැදි ජනතාවගේ ව්‍යාප්තිය ලංකාව පුරා ම විසිරී පැවති ඇති බව සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුව තහවුරු කරගත හැකි වේ. මහනුවර රාජධානි සමයෙහි වැදි ජනයා මාතලේ ප්‍රදේශයේ ද වාසය කළ බවට සාධක තිබීම මඟින් ඒ බව තහවුරු වේ (මවැව). පහළොස් වැනි සියවසේදී පමණ රචිත කොහොඹා කංකාරියෙහි "වැද්දන්ට අඩ ගැසීමේ" කවිවල වැද්දන් සිටි ස්ථාන 84ක් හඳුන්වා දී ඇති බව මෙහිලා සඳහන් කල යුතුම ය (ගොඩකුඹුරේ,1963:15). උතුරු, උතුරු මැද, ඌව ආදී පළාත් මූලික කරගෙන රටපුරා පැවති මෙම ජන පිරිස වර්තමානයේ ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී සිටී, සමාජ කොන් වීම, මහ සමාජයේ බලපෑම, වාසභූමි අහිමිවීම, ප්‍රධාන සමාජ ප්‍රවාහයට නතුවීම, ජීවනෝපායන් අහිමිවීම, යනාදි කරුණු

රැසක් හේතුවෙන් වර්තමානය වන විට ප්‍රධාන වශයෙන් මහියංගනය, දඹාන, දිඹුලාගල, ඉගිනියාගල, පොල්ලේබැද්ද යන ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී සිටි. ඔවුන් ද පාරම්පරික සංස්කෘතික ලක්ෂණ පෙන්නුම් නොකරන අතර යතෝක්ත හේතු සාධක හමුවේ ප්‍රධාන සමාජ ප්‍රවාහයට එක්වෙමින් සිටී (හුරුළුවැව,2011:98).

## පූර්ව පර්යේෂණ

ලෝකයේ මෙතෙක් මඳ වශයෙන් හෝ ශේෂ වී ඇති ආදිවාසි සංස්කෘතීන් අතරින් ශ්‍රී ලාංකික වැද්දන්ට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. මෙම ජන වර්ගය පිළිබඳ ව අතීතයේ පටන් අද දක්වාම දේශීය මෙන් ම විදේශීය විද්වතුන්ගේ ද නොමඳ අවධානයට ලක් වී ඇති බව ඔවුන්ගේ පර්යේෂණ තුළින් පෙනි යයි.

1911 වර්ෂයේ දී වැදි ජනයා පිළිබඳ ව ඉතා පුළුල් ගවේෂණයක් කළ සී.ජී සෙලිග්මාන් සහ බ්‍රෙන්ඩා සෙලිග්මාන් විසින් තම ගවේෂණයට භාජනය වූ වැදි ජනාවාස 12ක් පිළිබඳ සඳහන් කර තිබේ (රත්නපාල,2003:4).

1963 දී වැදි ජනාවාස පිළිබඳ ව ගවේෂණයක යෙදුනු එම්.ඩබ්ලිව් සුගතපාල ද සිල්වා සඳහන් කරන්නේ එම ස්ථාන අතරින් තුනක් හැර අන් සියලු වැදි ජනාවාස අභාවයට ගොස් ඇති බව ය (විජේසේකර,1963:39).

1803 දී ලක්දිව වැද්දන් පිළිබඳ විස්තරයක් ලියු පර්සිබල් නැමැති බ්‍රිතාන්‍ය ජාතික ලේඛකයා එදා වැදි ජනතාව විසු ප්‍රදේශ පිළිබඳ සඳහන් කරයි (මවැව,ii,24:207).

ඊ.එම් රත්නපාල විසින් 2003 ලංකාවේ වැද්දෝ හා 2009 ශ්‍රී ලංකාවේ වැදි ජනයා නමින් රචිත කෘති තුළින් මෙරට වැදි ජනයා පිළිබඳ ඔහුගේ පුළුල් පර්යේෂණ එළිදක්වා ඇත.

1937 දී ලංකාවේ ආණ්ඩුව මඟින් කොළඹ ජාතික කෞතුකාගාරය මැදිහත් ව සිදු කර ඇති මානවවංශ විද්‍යා සමීක්ෂණයක් පවත්වා ඇත. එය එවකට ලංකාවේ විවිධ පළාත්වල ස්ථාන 50ක පුද්ගලයන් 3585 දෙනෙක් පරීක්ෂාවට ලක් කරමින් J.R.H. මැරට් හා නන්දදේව විජේසේකර විසින් වැදි ජනතාවගේ විවිධ ප්‍රභේද හා ශාරීරික ලක්ෂණ හඳුනාගෙන ඇත. සිරාන් දැරණියගල විසින් ද වැද්දන්ගේ ශරීර ලක්‍ෂණ පිළිබඳ අදහස් දක්වා ඇත (හුරුළුවැව,2011:101-105).

## සමාජ ව්‍යුහය

ලාංකික ආදිවාසීන් අතර ප්‍රමුඛස්ථානයක් හා දැනට ජීවමාන සාධක පිළිබිඹු කරන ජන කොට්ඨාසයක් වන වැදි ජනතාවගේ සමාජ ව්‍යුහය සකස් වි ඇත්තේ ස්වාභාවික පරිසරය කේන්ද්‍ර කරගෙන ය. දඩයම මූලික ජීවනෝපාය කරගනිමින් මුල් කාලීන ව පැවතියත් කල්යත් ම ගොවිතැන හා කෘෂිකර්මාන්තය කෙරෙහි ද ඔවුන් නැඹුරු වී ඇත (හුරුළුවැව,2011:276). කටුමැටි වරිච්චි බිත්ති හා කොළ අතු හා පොල් අතු ආධාරයෙන් තම වාසස්ථාන සකස් කර ගන්නා වැදිජනයා බොහෝ විට කණ්ඩායම්, කුල වශයෙන් ගම්මානයක ජිවත් වෙති (රත්නපාල,2003:54). වර්තමානයේ දී රාජ්‍ය අනුග්‍රහය හා තම තමන්ගේ

ආර්ථික තත්ත්වය මත මෙම වාසස්ථාන ආවේණිකවාදී සංස්කෘතියෙන් නික්මෙමින් පවතී.

මෙම ජනයාගේ සිරිත්විරිත්, ජීවන කටයුතු ද්වාර කර්ම ආදිය ද විශේෂිත බවක් දක්වන අතර ඒවා තමන්ගේ අභිවෘද්ධිය උදෙසා මෙන් ම ආදායම් මාර්ගයක් ලෙස ද වර්තමානයේ දී භාවිතයට ගැනේ. පුරුෂ පාර්ශවය දඩයම හා ගොවිතැන් කටයුතුවල නිරත වන අතර කාන්තාවන් පැදුරු විවීම, මාල ගෙතීම, දුනු ඊතල සැකසීම යනාදියෙහි නිරත වෙති. සරල හා චාම් ආභරණ හා ඇඳුම් පැළඳුම් පවතින අතර අතීතයේ දී කොළ අතු පමණක් හැදි බව කියැ වේ (හුරුලුවැව, 2011:159). විවාහ කටයුතු සඳහා ද පිළිගත් චාරිත්‍ර විධි හා සිරිත් ඇති අතර බොහෝ විට තම කුලයෙහි ම තම ග්‍රාමයෙහි ම එම කටයුතු සිදු වේ.(එම) සාමකාමීව හා සරල දිවි පෙවතකට උරුමකම් කී වැදි ජනතාවගේ සමාජ රටාව කලින් කලට වෙනස්වීම් වලට භාජනය වෙමින් තවදුරටත් යම් පමණින් හෝ පැවතීම සතුටට කරුණකි.

## ඇදහිලි/විශ්වාස/භාෂාව

ආදිවාසීන් අතර ඔවුනොවුනට උරුම වූ ආගමික විශ්වාස පවතී. එම ආගමික විශ්වාස සමඟ එකට බැඳුණු ඇදහිලි ක්‍රම සමූහයක් ද පවතී. වැද්දන් අතර පවතින බොහෝ ආගමික විශ්වාස හා චාරිත්‍ර පාරම්පරිකව ඔවුනට හිමිවුණු ඒවා ය. සිංහල සමාජයේ බලපෑමෙන් ද ඇතැම් ආගමික චාරිත්‍ර ඔවුනට පුරුදු වී තිබෙන බව පෙනෙන්නට තිබේ.

එම ඇදහිලි විශ්වාස අතර නෑ යකුන් පිදීම යනු මූලිකාංගයකි. දඩයම් සාර්ථක කර ගැනීමට මෙන් ම රෝග උපද්‍රව ආරක්ෂාව වෙනුවෙන් ද මෙය සිදු කරයි. වෙනත් යක්ෂයන් පිළිබඳ ව හෝ භූතයන් පිළිබඳ ව විශ්වාසයක් ඔවුන් අතර නැත. ආගමික උත්සවයන් ලෙස, ඊතලේ නැටුම, නෑයකු උත්සවය, පතයකා උත්සවය, බඹුර යකා උත්සවය ආදී වැදි නැටුම් ද පවත්වනු ලැබේ (හුරුලුවැව, 2011:232).

කිරි කොරහා යාගය නමින් පවත්වාගෙන යනු ලබන අංගය ද ආගමික වතාවත් අතර ඉතා ප්‍රසිද්ධ වේ. වසරකට වරක්වත් මෙය සිදුකරන අතර ලෙඩ දුක්වලින් තොරවීම හා දඩයම සාර්ථක කරගැනීමේ අරමුණින් මෙය සිදුකරයි. මෙම සෑම නැටුමකම දක්නට ලැබෙන එක් පොදු ලක්ෂණය නම්, ඉතා සෙමින් පටන්ගෙන වේගවත් අවසානයක් කරා ලඟාවීමයි. මෙම උත්සව ආගමික උත්සව ලෙස හැඳින්වුව ද ඒවා නියමිත සංස්ථාපිත ආගමක් නියෝජනය නොකරයි (හුරුලුවැව, 2011:234).

වැදි ජනයාගේ ඇදහිලි හා විශ්වාස අතර මන්තර සඳහා ද ප්‍රමුඛස්ථානයක් හිමිවේ. මන්තර මැතිරීමෙන් ජීවිතයට සහනයක් සැලසෙන බවට ඔවුහු විශ්වාස කරති. එයින් ලෙඩදුක් සංසිඳීම හා සතුන්ගෙන් පීඩා නොවීම ඒ අතර වේ. අලියා සඳහා, වල්මීමා, වළහ, නයා හා මී වදවල පැණි වැඩිකර ගැනීම සඳහා මෙන් ම ලෙඩ රෝග සඳහා ද වෙන වෙන ම මන්තර පවතී. වැදි ජනතාව යකුන් පිදීම, දෙවියන් ඇදහීම මෙන් ම කිරි අම්මාවරු ඇදහීම, වල්ලි අම්මා පිදීම, කතරගම

දෙවියන් ඇදහම් ආදියෙහි ද නිරත වෙති (හුරුළුවැව, 2011:234-243).

වැදි ජනතාවගේ භාෂාව පිළිබඳ ව සැලකීමේ දී මොවුන්ට ආවේණිකවූත්, විශේෂිතවූත්, වර්තමානයේ දී වියැකී යන්නාත්වූත් භාෂා රටාවක් පවතී. වැදි ජනයාගේ භාෂාව පිළිබඳ ව විද්වත්හු රැසක් පර්යේෂණ සිදුකර ඇති අතර ඔවුන් තම තමන්ට ආවේණික වර්ග කිරීම් යටතේ ආදිවාසි යෙදුම් දක්වා තිබේ. කලින් කලට කරන ලද පර්යේෂණවල දී මෙම වචනවල වෙනස්කම් ද හඳුනාගත හැකි ය. උදාහරණ ලෙස, විජේසේකර හා සෙලිග්මාන් තමන්ගේ ග්‍රන්ථවල පලකර ඇති ඇතැම් වචන අවිද්‍යමාන ය. ඇතැම් විට ඒවා ව්‍යවහාරයෙන් ගිලිහී ගොස් ද තිබිය හැකි ය. නමුත් මෙහි දී අවධානය යොමුවිය යුත්තේ සමකාලීන සමාජ තත්ත්වයන් හමුවේ වෙනස්වන ජන කණ්ඩායමක භාෂාව ද එයාකාරයෙන් ම වෙනස්වන බව ය (හුරුළුවැව, 2011:284-304).

වැදි ජනවහර අතර නිරන්තරයෙන් දැකිය හැකි වචන කිහිපයකි.

මං, මංදෝකරනවා, ඇත්තෝ, පොජ්ජ (එම)

මෙම වචනවලට සමගාමී ව අනෙකුත් වචන හා වාක්‍ය සකසාගෙන ඇති බව හඳුනාගත හැකි ය.

බුද්දලැත්තෝ - බුදුහාමුදුරුවෝ
අම්මිලැත්තෝ - අම්මා
අප්පිලැත්තෝ - තාත්තා
දෙයියලැත්තෝ - දෙවියෝ
තුන්වැලැත්තෝ - මුණුබුරා (එම)
බොටකදලැත්තෝ - අලියා
පෙඟිචලැත්තෝ - සර්පයා

රුකුල් පොජ්ජ මන්දෝකරනවා - ගෙයක් හදනවා (එම)

නමුත් මෙම ජනවහර අදවන විට සීඝ්‍රයෙන් වියැකී යන අතර ඇතැම් වැදි ගම්මානවල සම්පූර්ණයෙන් ම පාහේ භාවිතයෙන් තොර ය. පොල්ලේබැද්ද ගම්මානය ඊට නිදසුන් ය. මෙහි දී 1935 දී වැදි භාෂාව පිළිබඳ ව ගවේෂණයක යෙදුණු විලියම් ගයිගර්ගේ අදහස් දැක්වීම අගනේ ය. "වැද්දෝ අභිමානවත් ජනතාවක් වෙති. ඔවුහු දේශයේ මුල් අයිතිකරුවන් ලෙස සිංහලයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වන්නෝ ය" (හුරුළුවැව, 2011:126).

## සංස්කෘතික වෙනස්වීම

වැද්දන්ගේ සාම්ප්‍රදායිකත්වය වෙනස්වීම ආරම්භ වූයේ සියවස් එකහමාරකට පෙර සිට යැයි කිවහොත් වැරදි නොවේ (හුරුළුවැව,2011:266). ස්වාභාවික පරිසරය සමඟ ගැටෙමින් සමාජ සම්බන්ධතා පවත්වමින් ජීවත්වන ජන කොටසක ක්‍රමානුකූල වෙනස්වීමක් ඇතිවීම සාමාන්‍ය තත්ත්වයකි. නමුත් වැදි ජනතාව තුළ ඇති වූයේ එබඳු ක්‍රමානුකූල වෙනස්වීමක් නොවේ. නවීකරණය සහ ජනපදකරණය වැනි සාධකවල බලපෑම් නිසා දහනව වැනි සියවස අවසන් භාගය වනතුරු දඩයම් යුගය, ප්‍රාථමික ගොවි යුගය නියෝජනය කළ වැදි ජන සමාජය සීඝ්‍ර පරිවර්තනයකට ලක්විය.

වැද්දන් කොතරම් දුරට සංස්කෘතික වෙනස් වීමේ ක්‍රියාවලියට භාජනය වී

ඇත්දැයි පැහැදිලි කර ගැනීමට ඔවුන් පිළිබඳ ව අධ්‍යයනය කළ නන්දදේව විජේසේකරගේ ප්‍රකාශවලින් උපුටා දැක්විය හැකි ය (විජේසේකර, 1987:135).

"මිෂනාරියා ඔවුහු ආගමට හරවයි. දේශ සංචාරකයා ඔවුන්ගෙන් විනෝදයක් ලබයි. පර්යේෂකයාට ඔවුහු අධ්‍යයනයට ලක්වන මාතෘකාවකි. අසල්වැසියාගේ හෙළා දැකීමට ලක් වේ. මේ ආදි ලෙස වැද්දන් නිරන්තර ගැටීම්වලට ලක් වේ" (එම).

වැදි ජනතාව පිළිබඳ කරුණු රැස්කල ස්පිට්ල් වැද්දන්ගේ වෙනස් වීමට බලපෑ කරුණු ඉදිරිපත් කරයි.

- සිංහල හා දෙමළ ජනතාව සමඟ නිරන්තරයෙන් සම්මිශ්‍රණය වීම.
- වැද්දන් ශිෂ්ට සම්පන්න කිරීමට වරින් වර රජය ගත් ක්‍රියාමාර්ග.
- කෘෂිකර්මාන්තයට යොමු වීම.
- මිෂනාරි බලපෑම.
- ඔවුන්ගේ ඉඩම් රජයෙන් අත්පත් කර ගැනීම.
- වැදි ගම්මාන සඳහා වාහනවලට යා හැකි මාර්ග ඉදිවීම (එම).

මීට අමතර ව වැද්දන්ගේ නිජබිම් ලෙස පැවති ප්‍රදේශවල මහවැලි ව්‍යාපාරය වැනි ගොවි ජනපද ව්‍යාපාර ආරම්භ වීම නිසා ද වැද්දෝ සිසු වෙනස් වීමකට භාජනය වූහ (හුරුලුවැව,2011:95). වර්තමානයේ දී නියම ආදිවාසි සංස්කෘතියට අනුගත ව ජීවත් වන වැදි ජනගහනය අඩුවෙමින් පවතී. ඇතැම් පිරිස් වැද්දන් ලෙස හඳුනාගැනිමට පවා අපහසු තත්ත්වයක් උදා වී තිබේ. අද වන විට බොහෝ වැදි ජනතාව නාමික ව පමණක් වැද්දන් වෙති.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය


හුරුලුවැව, ජයසෙනෙවි. (2011) ***ලාංකීය ආදිවාසි ජන සමාජය:*** අකුර පොත් ප්‍රකාශකයෝ.

රත්නපාල, ඊ. ඇම්. (2003) ***ලංකාවේ වැද්දෝ:*** ආරිය ප්‍රකාශකයෝ.

මධ්‍යම උපදේශන කාර්යංශය, ***මහවැලි වංශය:*** (1984) මධ්‍යම උපදේශන කාර්යංශය.

ගොඩකුරේ, චාල්ස්. (1963) ***කොහොඹා කංකාරිය:*** කොළඹ ප්‍රකාශකයෝ.

විජේසේකර, නන්දදේව. (1987) ***වැද්දන්ගේ විකාශන ක්‍රමය:*** සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රකාශනයකි.

රත්නපාල, නන්දසේන. (2001) ***මානව විද්‍යාව:*** ආරිය ප්‍රකාශකයෝ.

විජේසේකර, නන්දදේව. (1969) ***ලංකා ජනතාව:*** සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රකාශනයකි.